දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, மாகம் ருஹுனுபுர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர, ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"செளபாக்கியமான எதிர்காலத்திற்காக"
"For a prosperous future"

මගේ අංකය / எனது இலக்கம் / My No: DSH/DPS/07/DCC/වාර්තා/2025
ඔබේ අංකය / உமது இலக்கம் / Your No:
දිනය / திகதி / Date: 2025.04.03

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2025.03.26</u>**

*2025.03.26* වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03.ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින 14 ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail.com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

පිටපත්:-

01. දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස
03. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස


| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary – 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / மேலதிக மாவட்ட செயலாளர் (நிர்வாகம்) / Additional District Secretary (Admin) – 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / மேலதிக மாவட்ட செயலாளர் (காணி) / Additional District Secretary (Land) – 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / கணக்காளர் / Chief Accountant – 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / பணிப்பாளர் (விவசாயம்) / Director (Agriculture) – 047 3628890 | අධ්‍යක්ෂ (සංවර්ධන) / பணிப்பாளர்(திட்டமிடல்) / Director (Planning) – 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / உதவி மாவட்ட செயலாளர் / Assistant District Secretary – 047 2256945 | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer – 047 2256285 |
| කාර්යාලය / அலுவலகம் / Office | ෆැක්ස් / தொலை நகல் / Fax – 047 2256235, 047 2256247 | ඊ මේල් / மின்னஞ்சல் / email : moha.dist.hambantota@gmail.com; වෙබ් අඩවිය / இணையத்தளம் / Web site : www.hambantota.dist.gov.lk | |

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම</u>**

**<u>2025.03.26</u>**

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.03.26 වන දින පෙ.ව. 9.30ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය මත හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදී.

ගරු සභාපති තුමා විසින් පැමිණ සිටි සියළුම දෙනා පිලි ගැනීමෙන් අනතුරුව, පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කරන ලද අතර පසුගිය වාර්තාවේ අනු අංක 2.2 හි තීරණය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව ලෙස සටහන්ව තිබූ අතර එය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ආවරණ අනුමැතියට යටත්ව ලෙස සංශෝධනය කිරීමෙන් පසු වාර්තාව සම්මත කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | **2025.02.28 දිනැති පසුගිය රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම.** | | | |
| 01 | සූරියවැව හබරත්තවල මාර්ගයේ කොටසකට විදුලිය නොමැති වීම. | විදුලිය මෙම කොටසට ලබා දීම සඳහා රු.9189112.82 ක ඇස්තමේන්තුවක් විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති බව දන්වන ලදි. | පළාත්සභා විෂයභාර අමාත්‍යාංශය වෙත යොමු කිරීමට තීරණය කරන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br>ප්‍රධාන ඉංජිනේරු හම්බන්තොට |
| 02 | ආයුර්වේද රෝහල අසල සිට තිස්ස හන්දිය දක්වා විදුලිය ලබා දීම. | ආයුර්වේද හංදියේ සිට කතරගම පිවිසුම දක්වා කොටසෙහි විදුලි රැහැන් ඇදීම සඳහා රු.1643149.39 ක ඇස්තමේන්තුවක් විදුලිබල මණ්ඩලය මඟින් ඉදිරිපත්කර ඇති බවත් එතැන් සිට BLACKSTONE හෝටලය දක්වා කොටසෙහි වීදි ලාම්පු නැවත සක්‍රීය කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සිදුකිරීමට ප්‍රධාන කාර්යාලයෙන් එකඟතාවය ලැබී ඇති බවත් නඩත්තු කටයුතු නගර සභාව මඟින් සිදුකිරීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය.<br>මෙම විදුලි සම්බන්ධතාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව සඳහා ප්‍රතිපාදන දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදි. | නඩත්තු කටයුතු නගර සභාව විසින් සිදුකිරීමටත් එකී කටයුතු වලදී අමතර ප්‍රතිපාදනයක් අවශ්‍යවුවහොත් දකුණු පළාත් ආණ්ඩුකාර කාර්යාලය මඟින් ඉල්ලීමක් කර අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය<br>නාගරික කොමසාරිස්, හම්බන්තොට<br>පළාත් පාලන සහකාර කොමසාරිස්,<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු, හම්බන්තොට |
| 03 | ගජසමරගම ඉඩම්ලාභීන්ට ඉඩම් ඔප්පු ලබා ගැනීමට නොහැකි වීම . | හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ නිවාස ව්‍යාපෘති 333 ක් ක්‍රියාත්මක වී ඇති බවත් ඉන් 131 ක් ප්‍රාදේශීය ලේකම් මඟින් ද 202 ක් නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ද ප්‍රතිලාභීන් හඳුනාගෙන ඇති බවට වනසංරක්ෂණ සීමාව ඇතුලත පවතින ඉඩම්වල සහ ප්‍රාදේශීය ලේකම් සතු ඉඩම්වල ගැටලු පවතින බවට කරුණු ඉදිරිපත් විය.<br>එසේම ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් නිසි අවසරය ලබා නොගෙන සිදුකර ඇති බව පැහැදිලි කරන ලදි. | මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමේදී අදාල ඉඩම් සඳහා යටිතල පහසුකම් පිලිබඳව නිසි අවධානයකින් තොරව සිදුකිරීම තුළ ගැටලු රාශියක් මතුවී ඇති බවත් ලංකාවේම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මෙම තත්ත්වයට පත්ව ඇති බවත් සාකච්ඡා වූ අතර මේ සඳහා ජාතික මට්ටමින් ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු බවට පැහැදිලි කර දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br>දිස්ත්‍රික් කළමණාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>දිසාවන නිලධාරී හම්බන්තොට |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 04 | නිවාස සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් සඳහා ඔප්පු ලබා දීම | ටෙනිසන් එදිරිසූරියගම ගම ගුණපාල තිස්සකුට්ටිආරච්චිගම යන නිවාස ව්‍යාපෘති 02 ක නිසි අනුමැතියකින් තොරව වනසංරක්ෂණ සීමාව තුළ ඉදිකර ඇති බවත් ඇතැම් නිවාස ව්‍යාපෘති 100% ආධාර පදනමක් යටතේ ක්‍රියාත්මක කර ඇති බව ප්‍රතිලාභීන්ට දන්වා ඇතත් එම මුදල අයකර ගැනීමට සිදුවන බවත් මෙම ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන්ද යම් මුදලක් වැයකර තිබීම නිසාත් වාරික අයකර ගැනීම දැඩි අර්බුදයකට ලක්ව ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එසේම, නිවාස සංවර්ධන අධිකාරිය මාසික ඉලක්කයක් ලබා දී මෙම ප්‍රතිලාභීන්ගෙන් ඉහත කී මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් සිටින බවටද කරුණු ඉදිරිපත් විය. | 2016 වර්ෂයේ සිට එක් එක් ආයතනවලට අයිති භූමි තුළ අනවසර ලෙස ඉදිකර ඇති සියලුම නිවාස ව්‍යාපෘති සම්බන්ධව වෙන් වෙන් වශයෙන්<br>• ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ පදනම<br>• ප්‍රතිලාභීන් හඳුනාගැනීමේ වගකීම දරන ලද්දේ කවුරුන්ද<br>• නිවාස සඳහා ප්‍රතිලාභීන්ගේ සහ රජයේ දායකත්වය හා වෙනත් දායකත්වයන්<br>යන කරුණු ඇතුලත් සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්)<br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br>දිසාවන නිලධාරි<br>දිස්ත්‍රික් කළමණාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 05 | කිරින්ද ධීවර වරායේ අධික ලෙස වැලි ගොඩ ගැසීම නිසා අවට ප්‍රදේශයේ නිවාසවල ජීවත් වීමට නොහැකි තත්ත්වයක් උද්ගතවීම. | මෙකී වරායෙන් ඉවත් කරන වැලිවලින් නිර්දේශ කරන යම් ප්‍රමාණයක් මුහුදට නැවත මුදා හැරිය යුතු අතර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යෝජනාව පරිදි මේ සඳහා රු.මි.250 කට ආසන්න මුදලක් වැයවන බවත් අනෙක් ප්‍රමාණය අලෙවි කිරීමටත් කටයුතු කල යුතු වුවත් මේ වන තෙක් කපා ගොඩගසන ලද සියළු වැලි සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් අවට ප්‍රදේශයේ ජනතාවට හා පරිසරයට අහිතකර බලපෑම් එක්කරන තත්ත්වයකට පත්ව අති බවට අනාවරණය විය.<br>තවද, වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්ගේ දැනුම්දීම අනුව වැලි කියුබ 14000 ක් මුහුද වෙත මුදාහැරීම ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් සිදුකල යුතු බව වැඩිදුරටත් සාකච්ඡා විය.<br>එසේම, මෙම වැලි වල වටිනාකමින් යුතු ඛනිජ ද්‍රව්‍ය පවතීද යන්න පරීක්ෂා කිරීමට යොමු වී ඇති බවත් ඒ සඳහා මාස 03 ක් පමණ කාලයක් වැය වන බවටත් උද්ගතව ඇති ගැටළුකාරී තත්ත්වය මත මෙම වැලි ඉවත්කිරීම ප්‍රමාද කල නොහැකි බවටත් අදහස් ඉදිරිපත් විය. | පවතින තත්තත්වය පිළිබඳ සැලකිළිමත් වෙමින් ප්‍රායෝගික හා කඩිනම් වැඩපිළිවෙලක් සකස්කර ක්‍රියාවට නංවන ලෙස උපදෙස් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>කළමනාකරු ධීවර වරාය, කිරින්ද<br>කැණීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br>සහකාර අධ්‍යක්ෂ වෙරළ හා පාරිසරික සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 06 | යටාලතිස්ස පාසල් අධ්‍යාපනයෙන් පසු 6 වසර සඳහා සිසුන් ඇතුළත් කිරීම | වාර්ෂිකව මතුවන ගැටලුවක් වන මෙය යටාලතිස්ස පාසල් අධ්‍යාපනයෙන් පසු දෙබරවැව ජාතික පාසලට ඇතුලත් කරන ළමුන් සංඛ්‍යාව සීමිත වීම හේතුවෙන් ඉතිරි සිසුන් සඳහා අසාධාරණයක් සිදුවන බවට කරුණු ඉදිරිපත් විය.<br>දිස්ත්‍රික්කය තුළ අමාත්‍යාංශ මට්ටමට දැනුවත් කලද දිර්ඝකාලීනව ගැටලු මතුවන පාසල් පවතින බවද වැඩිදුරටත් සාකච්ඡා විය. | මෙම සිසුන් හට සිදුවන අසාධාරණය වලක්වා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදි.<br>එසේම, දිස්ත්‍රික්කයේ පාසල් සම්බන්ධයෙන් පවතින ගැටලු සඳහා කඩිනම් හා ප්‍රායෝගික විසඳුම් ලබා ගැනීම සඳහා | දිස්ත්‍රික් ලේකම්<br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, හම්බන්තොට / තංගල්ල/ වලස්මුල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා කැඳවීම් කලයුතු බවට තීරණය කරණ ලදි. | |
| 07 | තංගල්ල කළාපයේ අලුත්වැව ප්‍රාථමික විද්‍යාලය සිදුවූ සොරකම සම්බන්ධව | මෙම සොරකම සඳහා විදුහල්පති තුමා වෙත චෝදනා ඉදිරිපත් වුවත් එය පරික්ෂණ මඟින් සනාථ නොවී ඇති හෙයින් සිදුකරන ලද පරික්ෂනයෙන් පසු ගත් නිර්දේශ ක්‍රියාත්මක කර නොමැති බවට කරුණු ඉදිරිපත් විය.<br><br>එහෙත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පරික්ෂණ නිර්දේශය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බැවින් පළාත් අධ්‍යාපන ලේකම් විසින් 2025.03.06 දින නැවත ස්වාධීන විමර්ෂන කමිටුවක් පත්කර විමර්ෂන කටයුතු ආරම්භ කර ඇති බවට ද පොලිස් පරික්ෂණ තවමත් සිදුකරන අතර මෙතෙක් සොරාගත් භාණ්ඩ කිසිවක් සොයාගෙන නොමැති බවට ද පැහැදිලි කරන ලදි. | මෙම ගැටලුව සිදුවී මාස 08ක් පමණ කාලයක් ගතවී ඇති අතර කඩිනමින් පරික්ෂණ සිදුකර නිර්දේශ ලබාගතයුතු බවට උපදෙස් දෙන ලදි. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, තංගල්ල |
| 08 | වලස්මුල්ල ජාතික පාසලේ බන්ධනාගාරගතවූ ගුරුවරයා සම්බන්ධ ගැටලුව | මෙම ගුරුවරයා බන්ධනාගාර ගතවූවත්වැඩ තහනම්කර නොමැති අතර පසුව පරික්ෂණ අවසන් විමකින්තොරව සේවයට වාර්තා කර ඇති බවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ දැනුම් දීම මත මූලික විමර්ෂණයක් කිරීමට යටත්ව වැටුප් ගෙවීමත් සිදුකර ඇතිබවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සිද්ධිය සම්බන්ධව පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙසට උපදෙස් දෙන ලදි. | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වලස්මුල්ල |

**අනතුරුව 2025.03.26 දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සකච්ඡා කරන ලදි. ඒවා පහත පරිදි වේ.**

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම | 2025 වර්ෂය සඳහා<br>• විමධ්‍යගත අයවැය වැඩසටහන<br>දිස්ත්‍රික්කය සඳහා හඳුනාගෙන අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යෝජනා අතුරින් රු.මි.23.3 ක් සඳහා කටුවන, වලස්මුල්ල, වීරකැටිය, බෙලිඅත්ත, තංගල්ල, අඟුණුකොළපැලැස්ස, සූරියවැව, තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලින් යෝජනා 13 ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත්, විවිධ හේතු නිසා කටුවන ,වීරකැටිය,අම්බලන්තොට, හම්බන්තොට හා තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් රු.මිලියන 10.00කට අදාලව යෝජනා 07 ක් සංශෝධන සඳහා ඉදිරිපත් කර ඇති බව දැනුම් දෙන ලදී.<br>• ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන<br>ප්‍රවාහන මහාමාර්ග , වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කළ යුතු ග්‍රාමීය මාර්ග හඳුනා ගෙන අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ලබා දී තිබූ චක්‍රලේඛ උපදෙස් පරිදි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වල නිර්දේශ සහිතව ඉදිරිපත් කර තිබූ යෝජනා 1006 ක් පමණ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව අමාත්‍යාංශයට යොමු කළ | අනුමතකර ඇති සියළු ව්‍යාපෘති නියමිත චක්‍රලේඛ හා ප්‍රසම්පාදන ක්‍රම වලට අනුකූලව ක්‍රියාත්මක කරන ලෙසත් විමධ්‍යගත සංශෝධන සහ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති , වැසි ජල ටැංකි ලබා දීමේ ව්‍යාපෘති සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ ක්‍රම සම්පාදන (වැ.බ.)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බවත් ඒවායේ දළ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 10011.149 ක් බවත් කමිටුවට දැනුම් දෙන ලදී.<br>• වැසි ජල ටැංකි ලබා දීම<br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශ මඟින් ලීටර් 500ක ප්‍රමාණයේ වැසි ජලය එක්රැස් කිරීම සඳහා ප්ලාස්ටික් ටැංකි 50ක් ලබා දීම සඳහා ප්‍රතිලාභීන් තෝරා දෙන ලෙස කර ඇති යෝජනා පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විසින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නිර්දේශ සහිතව යොමු කර ඇති ප්‍රතිලාභී නාම ලේඛනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමුකරන ලදී. | | |
| 02 | පළාත් සභා සංවර්ධන වැඩසටහන් සම්බන්ධ දැනුවත් කිරීම | 2025 වර්ෂයට අදාලව දකුණු පළාත් සංවර්ධන සැලැස්ම තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා<br>• පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) - රු.මි. 1,458.24<br>• උපමාන පාදක ප්‍රදාන (CBG) - රු.මි. 145.839<br>වශයෙන් මුළු මුදල රු.මි. 1,604.079 ක් වෙන්කර ඇති අතර එකී මුදල් දකුණු පළාත් සභාවේ ඒ ඒ විෂයන්ට අදාලව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදී.<br>නමුත්, ඉහත ප්‍රතිපාදන වෙන් කිරීම යටතේ මෙම දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රමාණය සම්බන්ධව ගැටලුවක් නොමැති බවත් අනෙකුත් සියළු ක්ෂේත්‍ර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම ප්‍රමාණවත් නොවන බවත් අත්‍යාවශ්‍යයෙන්ම ක්‍රියාත්මක කලයුතු වැඩසටහන් රාශියක් දිස්ත්‍රික්කය තුළ පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br>තවද, ඉදිරියේදී පළාත් පාලන මැතිවරණය පැවැත්වෙන නිසා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීමට නොහැකි බැවින් මෙම ව්‍යාපෘති සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද විය හැකි බවත් පළාත් සභා වැඩසටහන සඳහා මුදල් කොමිෂන් සභාවෙන් දැනටමත් ප්‍රතිපාදන ලැබෙමින් පවතින නිසා ඇතැම් සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම කල හැකි බවත් ඒ සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල ආවරණ අනුමැතියට යටත්ව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දීම සඳහා පසුගිය රැස්වීමේදී ගනු ලැබූ තීරණය සඳහා මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා දෙන ලෙසද ඉල්ලීම් ඉදිරිපත් වූ අතර එවිට අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගතහැකි බවත් වසර අවසානයේදී ව්‍යාපෘති වලට මුදල් ලබා ගැනීමේදී ඇතිවන අපහසුතා මඟහරවා ගැනීමට හැකි බවට කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කල යුතු අත්‍යාවශ්‍ය ව්‍යාපෘති හඳුනාගෙන කඩිනමින් ඉදිරිපත් කරන ලෙස උපදෙස් දුන් අතර පළාත් සභා අමාත්‍යාංශ මඟින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන සියළු සංවර්ධන වැඩසටහන් සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී.<br>එමෙන්ම, එම වැඩසටහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ක්‍රියාත්මක කිරීමේදී ඒ පිළිබඳව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දැනුවත් කිරීමටද කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත<br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් (දකුණු පළාත)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| 03 | දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම | • පාසල් ළමුන්ගේ බෝ නොවන රෝග සම්බන්ධව ඇති දත්තවල කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස ළමා | දිස්ත්‍රිකත්කයේ සෞඛ්‍ය කටයුතු සක්‍රියව සිදුකිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස දැනුම් දෙන | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



ඩිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ස්ථූලතාවය 4%ක වර්ධනයක් පෙන්නුම් කරන බවත් එය ඉදිරි සෞඛ්‍ය පුරෝකථන සඳහා යහපත් නොවන හෙයින් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛනයට අනුව පාසල් ළමුන් අවම වශයෙන් සතියකට දින 2 ක් විනාඩි 20 බැගින් ව්‍යායාම කටයුතු සඳහ වෙන් කිරීම සුදුසු බව පැහැදිලි කරන ලදි.<br><br>• දිස්ත්‍රික්කය තුළ 2024 වර්ෂය තුළ සියදිවි නසාගැනීම් 102 ක් සිදුවී ඇති අතර සියදිවි නසාගැනීම් සඳහා උත්සාහ කර ඇති ප්‍රමාණය මීට වඩා ඉහල අගයක් ගන්නා අතර එසේ යොමු පිරිසගෙන් හදුනාගත් පිරිස සඳහා යහපත් මානසික සෞඛ්‍ය තත්ත්වයක් ඇති කර නැවත ඒ සඳහා යොමු නොවීමට අධීක්ෂණ ක්‍රියාවලියක් ලංකාවේ ප්‍රථම වරට හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ආරම්භ කලබව පැහැදිලි කරන ලදි.<br><br>• මේ වන විට ජලභීතිකා රෝගය වැලදීම අවම කිරීම සඳහා අයාලේ යන සුනඛයින් එන්නත් කිරීම සඳහා දිස්ත්‍රිකයේ සිටින නිලධාරීන් තිදෙනා ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රාදේශීය සභාවට අනුයුක්තව සේවය කරන බහුකාර්ය නිලධාරීන් සම්බන්ධ කරගනිමින් පුහුණුව ලබාදී එන්නත්කරණ කටයුතු සිදුකිරීමට උත්සාහ කරන බව හා එහි ප්‍රගතිය ඉදිරියේදී හදුනාගත හැකි බව දැනුම් දෙන ලදි. | ලදි. | දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන්<br><br>දිස්ත්‍රික්කයේ සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් |
| 04 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්ව පිළිබඳ දැනුවත් කිරීම | මිද්දෙණිය ත්‍රිත්ව ඝාතනය සම්බන්ධයෙන් 75% කට වැඩි තොරතුරු ප්‍රමාණයක් සොයාගැනීමට හැකි වූ බවත් විවිධ හේතූන් මත වාර්තා වන ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් පෙර පැවති තත්ත්වයට වඩා යහපත් තත්ත්වයක් පවතින බවත් ත්‍රිවිධ හමුදාව හා පොලිස් විශේෂ බලකාය ඇතුළු ආරක්ෂක අංශ වල සහයෝගය ඇතිව දිස්ත්‍රික්කයේ ආරක්ෂාව සහතික කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි. | සාමාන්‍ය ජනතාව පොලිස් ස්ථාන වෙත සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණි පසු ඔවුන් වෙනුවෙන් පෙර පැවති තත්ත්වයන්ට වඩා කඩිනම් හා සුහදශීලී සක්‍රිය සේවාවක් ලබා දීමට අවශය කටයුතු සලසන ලෙස සියළු පොලිස් ස්ථාන දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදි. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි, තංගල්ල |
| 05 | ගල්කොරි පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දීම සම්බන්ධ | දිස්ත්‍රික්කයේ පවතින ගල්කොරි සංඛ්‍යාව 52ක් වන අතර ඉන් වනජීවී සීමා කලාපයේ අභයභූමිය තුළ 6 ක් පවතින බව හා වනජීවී සීමා කලාපයේ අභයභූමිය නම්කරන ලද්දේ වනජීවීන්ගේ පැවැත්ම සඳහා තිරසර ආරක්ෂාවක් සහතික කිරීම සඳහා වන හෙයින්, එහි ගල්කොරි පවත්වාගෙනයාම හේතුවෙන් වනසතුන් ගමවැදීම නිසා අලිමිනිස් ගැටුම දක්වා විකාශයවී ඇති අතර දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික්කයේ පවතින අනෙක් ගල් කොරි මඟින් නිෂ්පාදිත ගල් කියුබ් ප්‍රමාණය | * එකී කලාපය තුළ මේ වන විට ක්‍රියාත්මක වන ගල්කොරි සඳහා පරිසර බලපත්‍ර ලබාදී ඇති දිනය වන තෙක් පමණක් ක්‍රියාත්මක කිරීමට අවසරය ලබාදෙන අතර අද සිට මෙකී සීමාව තුළ පවතින අනෙක් ගල්කොරි අත්හිටුවන බවට තීරණය කරන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>කැනීම් ඉංජිනේරු, පතල් හා භූ විද්‍යා දෙපාර්තමේන්තුව<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවී |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | හඳුනාගැනීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම, වනජීවී කළාපය නම්කිරීමට පෙර මෙම ගල්කොරි පවත්වාගෙන ආ බවත් ප්‍රාදේශීය අවශ්‍යතාවය සඳහා මෙම ගල්කොරි මඟින් ඉහල සැපයුමක් සපුරන බවක් ප්‍රකාශ කරන ලදි. | *එසේම, දිස්ත්‍රික්කය තුළ පවතින සියළු ගල්කොරි සම්බන්ධව වෙන් වෙන් වශයෙන් සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙසත් වනජීවී සීමාවෙන් පිටත ඛනිජ සම්පත් ලබා ගතහැකි ස්ථාන හඳුනාගෙන වාර්තා කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>දිසාවන නිලධාරී, හම්බන්තොට |
| 06 | හම්බන්තොට මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානය ඉදිරිපස භූමියෙන් බිම් කොටස් පුද්ගලික ආයතන වෙත බදු දීම සම්බන්ධව | ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරමින් දීර්ඝකාලීන බදුපදනම මත මෙම ස්ථානයෙන් හෙක්ටයාර් 2 ක් , 20 ක් සහ 8.5 වශයෙන් බිම්කොටස් ලබා දෙන ලෙස<br>1. P.U.J.S.Fernando & co.<br>2. SUPREME PETROA LANKA (Pvt)<br>3. Forset Fiends Ventures (Pvt)<br>මෙකී ආයතන 03ක් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | මෙම ව්‍යාපෘතිවල ශක්‍යතාවය සලකා බැලීමෙන් පසුව ඉදිරියේදී තීරණයක් ගතයුතු බව දැනුම් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>නාගරික කොමසාරිස්, හම්බන්තොට මහනගරසභාව |
| 07 | දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 7.1 | මුලටියන දෙයියන්දර මඩුවල තේක්කවත්ත පාලම ඉදිකිරීම සම්බන්ධයෙන් මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් කර ඇති යෝජනාව | ඕකෙවෙල කොට්ඨාසයේ පවතින මෙම පාලම දිස්ත්‍රික්කය තුළ පාලම් අවශ්‍යතා පවතින අවස්ථාවක වෙනත් දිස්ත්‍රික්කයකට ලබා දීමේ හැකියාවක් නොමැති බවත් එය දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවයකට යොදා ගන්නා ලෙසටත් පාලම සවිකල හැකි ස්ථානයක් පිළිබඳ සොයා බැලිය යුතු බව ද සාකච්ඡා විය. | දිස්ත්‍රික්කයේ අවශ්‍යතාව සඳහා ප්‍රමුඛත්වය දී ඇති බව දැනුම් දෙන ලෙස උපදේස දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය |
| 7.2 | වලස්මුල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා | | | |
| 7.2.1 | හ/වලස්මුල්ල ජාතික පාසලේ වැඩ ආරම්භ කරන ලද නමුත් වැඩ අවසන් නොකරන ලද ගුවන් පාලම පිළිබඳ | වලස්මුල්ල ජාතික පාසල සහ එහි ක්‍රීඩා පිටිය සම්බන්ධවන ලෙස ඉදිකිරීමට සූදනම්කර ඇති යෝජිත පාලම මේ දක්වා ඉදිකිර නොමැති බවත් සිසුන් 4000කට ආසන්නව ඉගනුම ලබන මෙම පාසල සඳහා මෙම ඉදිකිරීම අත්‍යාවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම, කොන්ක්‍රීට් නිමවුමක් වෙනුවට යකඩ පාලමක් ඉදිකිරීම වඩාත් යෝග්‍ය බවටත් කරුණු ඉදිරිපත් වූ අතර යුධ හමුදා ඉංජිනේරු බලකාය මෙවැනි ඉදිකිරීම් සිදුකරන බවටත් කරුණු ඉදිරිපත් විය. | යකඩ පාලමක් සකස් කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලෙසත් ඉදිකිරීම් සඳහා යුධහමුදා ඉංජිනේරු බලකාය යොදා ගැනීමේ හැකියාව සොයා බලන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>සේනාංකාධිපති, 12 වන සේනාංක මූලස්ථානය, |
| 7.2.2 | වලස්මුල්ල කොට්ඨාසයේ වරින් වර සිදුවන විදුලි ඇණහිටීම් නැවත යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රමාද වීම සම්බන්ධව | මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන ගැටළුවක් බවත් ඉන් රාජ්‍ය ආයතන ඇතුළු ප්‍රජාව දැඩි අපහසුතාවයට පත්වන බවත් දැනුම් දෙන ලදි. වලස්මුල්ල විදුලි උප පොලෙන් සේවා සපයන ප්‍රදේශය ඉතා විශාලවීමත් දෛනික බිඳවැටීම් නඩත්තු කිරීම සඳහා රථවාහන දෙකක් සහ කාර්ය මණ්ඩලයන් වෙන් කර ඇතත් දැනට විදුලිබල මණ්ඩලය මඟින් නිලධාරීන්ගේ පුහුණු | විදුලිය මහජනතාවට අත්‍යාවශ්‍ය පහසුකමක් වන බැවින් විදුලි බිඳවැටීම් කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධාන විදුලි ඉංජිනේරු, තංගල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කිරීමේ වැඩසටහනක් සංවිධානය කර ඇති බැවින් නිලධාරීන් භියක් ඇතිවී තිබෙන බවක් දන්වන ලදි.<br><br>එමනිසා එක් වාහනයක් පමණක් බිදවැටීම පිළිසකර කිරීමට යොදවා ඇති බවත් අප්‍රේල් මස පුහුණුව අවසන් බැවින් ඉතිරි නිලධාරීන්ද යෙදවීමෙන් මෙම ගැටළුව පාලනය කල හැකි බවත් දන්වන ලදි.<br><br>තවද, මෙම ප්‍රදේශයට නිරන්තර අධික වැසි සහ සුළං තත්ත්වයන් ඇතිවීමද විදුලි බිදවැටීම ඉහළයාමට හේතුවී ඇති බවද දන්වන ලදි. | | |
| **8** | වෙනත් | | | |
| **8.1** | දිස්ත්‍රික් මධ්‍යම පරිසර අධිකාරී කාර්යාලය හා භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය යන කාර්යාල පරිපාලන සංකීර්ණය තුළ ස්ථාපිත කිරීම | මහජනතාව අනවශ්‍ය ලෙස අපහසුතාවයට පත්වීමෙන් වලක්වාගැනීමටත් නිලධාරීන්ට නිදහසේ සේවය සැපයීම සඳහාත් සුදුසු වාතාවරණයක් ලැබීමටත් පිටස්තර ආයතනවලට අධික ලෙස ගෙවන කුළිය රාජ්‍ය ආයතනයකට ලබාගැනීමේ හැකියාවත් නිසා මෙම ආයතන පරිපාලන සංකීර්ණය තුළ ස්ථාපිත කිරීම අවශ්‍ය වන බවට කරුණු ඉදිරිපත් විය. | පරිපාලන සංකීර්ණය තුළ පවතින ඉඩපහසුකම් පිළිබඳව සොයා බලන ලෙසත් මෙම ආයතනද අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු ඉහළ නිලධාරීන් මේ සම්බන්ධව දැනුවත් කර අවශ්‍ය කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>කැණීම් ඉංජිනේරු, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය, |
| **8.2** | හේන් ගොවීන්ට ලබා දෙන වගා අවසරය | හේන් වගාවද අත්‍යාවශ්‍ය වගා ක්‍රමයක් බැවින් එය පවත්වාගතයුතු බවත් ඒ සඳහා අවසර දීමේදී රජයේ රක්ෂිතවලට හානි නොවන බවට වගබලා ගැනීමඅත්‍යාවශ්‍ය බවටත් කරුණු ඉදිරිපත් විය. | හේන් වගාව සඳහා අලුතින් ඉඩම් ලබා නොදීමටත් හේන් වගා සිදුකර අතහැර ඇති ඉඩම් වලින් එක් අයෙකුට ස්ථිර වගාවලින් තොරව හේන් වගාව සඳහා උපරිමය අක්කර දෙකක් වන ලෙස ලබාදීමට තීරණය විය. | අදාල ප්‍රාදේශිය ලේකම්වරුන්<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| **8.3** | ලුණුගම්වෙහෙර ධීවර කාර්මිකයින්ගේ ඉල්ලීම | වනජීවී රක්ෂිතය තුළ පිහිටි වැව්වල ධීවර කර්මාන්තයේ යෙදෙන පුද්ගලයන් ධීවර කටයුතුවල යෙදී රාත්‍රියේ එම ප්‍රදේශවල රැදී සිට උදෑසන එම රක්ෂිතයෙන් පිටතට පැමිණීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව දැනුම් දෙන ලදි.<br><br>එහෙත් පවතින නීතිය අනුව රක්ෂිත සීමාව තුළ ධීවර කටයුතු සඳහා අවසර ලබා දී තිබෙන්නේ උදේ 6.00 සිට සවස 6.00 දක්වා බවත් එය වෙනස් කර නොහැකි බවත් රාත්‍රි කාලයේ රක්ෂිත සීමාව තුළ රැදී සිටීම නිසා සතුන් දඩයම් කිරීම් වැනි කටයුතු පාලනය කිරීමට බාධා එල්ලවිය හැකි බවට කරුණු ඉදිරිපත් විය. | නීත්‍යානුකූලව කටයුතු කිරීමට උපදෙස් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) ඌව / දකුණ |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.4 | බහුකාර්ය දෙපාර්තමේන්තුව ට බඳවාගත් නිලධාරීන් ගේ පත්වීම් ස්ථිර කිරීම සම්බන්ධ ගැටළුව | මෙම දෙපාර්තමේන්තුවට බඳවාගෙන ස්ථිර පත්වීම් නොලැබූ පුද්ගලයින් මෙම දිස්ත්‍රික්කය තුළ 109 ක් සිටින බවත් ඔවුන්ට වැටුප් ගෙවීමට ප්‍රතිපාදන වෙන්ව තිබෙන්නේ අප්‍රේල් මාසයට පමණක් බැවින් දැඩි අර්බුධයකට ඔවුන් ලක්වන බවටත් කරුණු ඉදිරිපත් විය.<br>දකුණු පළාත් සභාවේම මෙම නිලධාරීන් යෙදවීම සඳහා පුරප්පාඩු 117 ක් පමණක් තිබෙන බවත් ඉදිරියේදී සම්මුඛ පරික්ෂණ මඟින් නියමිත NVQ මත බඳවා ගන්නා බවත් මෙම ගැටළුව ජාතික මට්ටමින් විසදිය යුතු ගැටළුවක් බවටත් කරුණු ඉදිරිපත් විය. | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට දැනුම් දීමට තීරණය විය. | ප්‍රධාන ලේකම්, දකුණු පළාත,<br>දිස්ත්‍රික් ලේකම්. හම්බන්තොට |
| 8.5 | උත්සව කාලයේදී දිස්ත්‍රික්කය තුළට වෙනත් ප්‍රදේශවලින් වෙළෙදුන් පැමිණීම | උත්සව සමය ආරම්භවීමත් සමඟ වෙනත් ප්‍රෙද්ශවලින් පැමිණෙන ව්‍යාපාරිකයින් භාණ්ඩ අළෙවි කිරීමට කටයුතු කිරීම නිසා එම ප්‍රදේශවල වෙළඳාම් කටයුතු කළ ව්‍යාපාරිකයන්ට දැඩි අභියෝග එල්ලවන බවත් එය නැවැත් වීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවටත් කරුණු දැක්විය. එහෙත් එවැනි කටයුතු නතර කිරීම සඳහා නීතිමය වශයෙන් ප්‍රති පාදන නොපවතින බවට වාර්තා විය. | ගැටළුවක් ඇති නොවන පරිදි කටයුතු කර ගැනීමට ඉඩදීම සුදුසු බව තීරණය විය. | සහකාර කොමසාරිස් (පළාත් පාලන)<br>පළාත් පාලන ආයතන ප්‍රධානීන් |
| 8.6 | කට්ටකඩුව වැවේ රොන්මඩ ඉවත් කිරීම | වැව තුළ එක්රැස්වී ඇති රොන් මඩ ඉවත් කිරීම සඳහා වරකට දළ වශයෙන් රු.මි.160ක් අවශ්‍ය වන බවත් වරින් වර රොන් මඩ ඉවත් කිරීම කල යුතු බවත් ඒ සඳහා විකල්පයක් ලෙස මෙම ජලාශයට චන්ද්‍රකා වැවෙන් නල හඟින් ජලය ගෙන ඒම සුදුසු බවටත් යෝජනා විය.<br>කෘෂිකාර්මික කටයුතු සඳහා පවතින ජලය ප්‍රමානවත් බවට කරුණු වාර්තාවූ අතර පානීය ජලය සඳහා නල මඟින් ජලය ගෙනඒමට ර.මි. 200ක් පමණ වැය වෙතැයි අපේක්ෂා කරන බවත් ජලසම්පාදන මණ්ඩලයට මෙම වියදම දැරිය නොහැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකා ජලසම්පාදන මණ්ඩලයට මේ වන විට වෙන්වී ඇති මුදල් නොව කමිටුවේ තීරණයක් ලෙස දන්වා ප්‍රධාන කාර්යාලයෙන් ප්‍රතිපාදන ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, වීරකැටිය<br>ප්‍රාදේශිය කළමනාකරු, ජලසම්පාදන |
| 8.7 | කෘෂිමාර්ග නඩත්තු නොකිරීමේ ගැටළු | නිසිපරිදි කෘෂිමාර්ග නඩත්තු නොකිරීම නිසා ගොයම් කපන යන්ත්‍ර ඇතුළුව කෘෂිකාර්මික ද්‍රව්‍ය ප්‍රවාහනයට විශාල වශයෙන් බාධා ඇතිවී තිබුන බවට කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම, කෘෂිමාර්ගවලට අවශ්‍ය බොරළු සපයාගැනීමේ ගැටළු දිස්ත්‍රික්කය පුරා පවතින නිසා මෙම ගැටළුව උග්‍රවී ඇති බවත් වාර්තා විය.<br>තවද, ඇතැම් කුඹුරුවල පවතින උස් ස්ථාන වලින්ද පස් සපයා ගැනීමට කටයුතු කල හැකි බවද දන්වන ලදි. | පස් ලබා ගත හැකි ස්ථාන වෙන වෙනම හඳුනා ගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදි. | සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්<br>දිසා වන නිලධාරීන් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 8.8 | වල්සපුගල විදුලි වැට ඉදිකිරීම | මේ වන විට සකස් කර ඇති විදුලි වැටෙන් කණුකිහිපයක් සඳහා වන අලින් හානිකර ඇති අතර නැවත පිළිසකර කිරීම සිදුකලත් නැවත එම තත්ත්වයම උදාවන හෙයින් මේ සඳහා GI බට භාවිතයෙන් කණු සකස් කල යුතු බවට යෝජනා වූ අතර ඒ සඳහා ඉහල වියදමක් වැයවන බවත් එමඟින්ද එක් පැත්තක් පමණක් ආවරණය වීමක් සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. | විදුලි වැට දෙපැත්තෙම වන අලින් ගැවසෙන හෙයින් එක්පසකට GI බටද අනෙක් පසට දැනට පවතින විදුලි වැටද වන සේ සකස් කිරීම සුදුසු වන හෙයින් ඒ සඳහා සුදුසු ක්‍රමවේදය පරික්ෂාකර බලා වාර්තා කරන ලෙස උපදෙස් දෙන ලදි. | සහකාර අධ්‍යක්ෂ (වනජීවී) දකුණ |

බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡාවූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 8.9 | | ➢ 2023 සහ 2024 වර්ෂවල කෘෂිකර්ම අංශය මගින් ක්‍රියාත්මක කරණු ලැබූ සියළු සංවර්ධන වැඩසටහන්වලට අදාළව වාර්තාවක් (ප්‍රතිලාභීන් සංඛ්‍යාව, ලබා දී ඇති උපකරණ, ප්‍රතිලාභීන් තෝරාගත් ආකාරය ) සති 02ක් ඇතුළත ලබා දෙන ලෙස දන්වන ලදී.<br><br>➢ පාසල් සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කර ඇති සියලු වැඩ සටහන් පිළිබඳ 2023 සහ 2024 වර්ෂයන්ට අදාලව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ<br><br>ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට/ තංගල්ල/ වලස්මුල්ල |

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 3. 30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 ~~මාර්තු මස~~ අප්‍රේල් මස 03 දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.